# කතුවැකිය

## ආලෝකය හා ආලෝක තාක්‍ෂණ

දහවල් කාලයේදී මදක් එළිමහනෙහි සිට ගෙන සිටින්න. ඔබ දකිනුයේ හිරුගේ ආලෝකයය. ඔබට දැනෙනුයේ හිරුගේ උණුසුමය. මදක් අවට නිරීක්‍ෂණය කරන්න. රාත්‍රී කාලයේදී ඔබ නොදුටු ගස් කොළන්, එල වැල ඇතුළු බොහෝ ආකර්ශණීය වස්තූන් ඔබ දෙනෙත් ගැටෙනුයේ හිරු ආලෝකයේ අරුමයෙනි. රාත්‍රියේදී ඔබගේ නිවස තුළ දැල්වෙන පහන්සිළුවකින් නික්මෙන ආලෝකය නොතිබෙන්නට ඔබට මුළු රැයම අන්ධකාරයේ ගිලී සිටින්නට සිදුවනු නියතය. හිරු මෙන්ම පහන්සිළුවද ආලෝකය පිටකරන වෙනක් වස්තූන්ද අප සලකනුයේ දීප්ත වස්තූන් ලෙසය. ලොව පවතින දීප්තිමත් වස්තුව සූර්යයාය. සූර්යයා නිසා ලෝකය පවතින බවට ද තර්කයක් නොමැතිය.

ආලෝකය යනු ශක්ති ප්‍රභේදයකි. විද්‍යාඥයන් මූලික හා සරලම වශයෙන් ශක්තිය යන්න නිර්වචනය කරනුයේ "කාර්යයක් කිරීමට පවත්නා හැකියාව" ලෙසය.

යම් ලෙසකින් අලෝකය නොතිබුනේයයි අනුමාන කරන්න. අවට ඇති වස්තූන් කිසිවක් අපට නොපෙනෙනවා පමණක් නොව අප ජීවත්වන ආකාරයෙන් අපට ජීවත්වීමට නොහැකිවන්නටද තිබිණ. ඇත්තවශයෙන්ම නම් එවිට අපට ජීවත්වීමට හැකියාව තිබේද යන්න පවා සැක සහිතය. අපට පමණක් නොව කොළ පැහැ ශාකයන්ටද සිය ආහාර නිෂ්පාදනය කරගැනීම සඳහා සූර්ය ශක්තිය අවශ්‍යය. අප ඇතුළු සියළු ලෝක සත්වයන් සෘජුව හෝ වක්‍රව හෝ යැපෙනුයේ සූර්යාගේ ආධාරයෙන් ශාක නිපදවන ආහාරයෙන් බවත් අමතක කළ නොහැකිය. එය පමණක් නොව අද අප ඉන්ධන ලෙස යොදාග නුයේද එදා සූර්යයා විසින් ශාක තුළ තැන්පත් කළ අද මිහිදන්ව පවත්නා ශක්තිය බව ඔබ නොදන්නේද?

සූර්යා ලෝකයෙන් ආලෝකය පමණක් ලබා ගෙන සෑනසීමට අපගේ අතීත මුතුන්මිත්තන් සූදානම වූයේ නැත. උදාහරණයක් ලෙස ප්‍රබල සූර්ය ශක්තිය උපයෝගී කර ගෙන තම ආහාරපාන සුරක්‍ෂිත කිරීම ආරම්භ කරන්නට ඇත්තේ යුග ගණනාවකට පෙරාතුවය. එහෙත් අද තරම් සූර්ය ශක්තියෙන් ප්‍රයෝජන ගැනීමට මිනිසා සමත්වූ යුගයක් තවත් නොතිබුනේය.

මේ හේතුව නිසාම එක්සත් ජාතින්ගේ සංවිධානය වර්ෂ 2015, ආලෝකය සහ ආලෝකය පදනම් තාක්‍ෂණ වර්ෂය ලෙස නම් කිරීමට පියවර ගත්තේය. මේ නම් කිරීම තුළින් එක්සත් ජාතීහු අපේක්‍ෂා කරනුයේ, බලශක්තිය, අධ්‍යාපනය, තොරතුරු, කෘෂිකර්ම, සෞඛ්‍යය අදී ක්‍ෂේත්‍ර ගණනාවක් තුළ මිනිසා මුහුණ දී ඇති අභියෝග ජය ගැනීම සඳහා විසඳුම් සංවර්ධනයේලා ආලෝකය සහ ආලෝක තාක්‍ෂණ යොදා ගැනීම පිළිබඳ ජගත්ජන අවධානයක් උත්පාදනය කිරීමය.

දැනටමත් මෙම ක්‍ෂේත්‍රය ලබා ඇති ප්‍රගතිය අතිමහත්ය. මිනිසාගේ බලශක්ති පිපාසය නිවාලන, දැරිය හැකි මිලකින් නිමවෙන සූර්ය කෝෂ හා සූර්ය පැනල ඇතුළු තාක්‍ෂණය ගැන මහත් බලාපොරොත්තු තැබිය හැකිය. අප හුස්ම ගන්නා වාතය, පානය කරන ජලය නව සූර්ය හා ආලෝක තාක්‍ෂණ ඔස්සේ වඩා හිතකර හා පිරිසිදු තත්වයට පත්කරන්නට පියවර තබා හමාරය.

2015 - ආලෝකය හා ආලෝක තාක්‍ෂණ වර්ෂය පිළිබඳ ශ්‍රී ලංකික පාසැල් ප්‍රජාව අවදි කිරීමට " විදුරාව" යම් පමණකින් හෝ මෙසේ කැසකවන්නේ එක්සත් ජාතින්ගේ මහා උත්සාහයට අල්ප ප්‍රමාණයකින් හෝ දායකවීමේ අපේක්‍ෂාවෙනි.

තුසිත මලලසේකර